


# මහින්දාගමනයෙන් අප ලත් දායාද

පොසොන් පුර පසළොස්වක පොහෝ දිනය ශ්‍රී ලාංකික බෞද්ධ ජනතාවට ඉතා වැදගත් වෙයි. සුදෝ සුදු වතින් සැරසුණු උවසු උවැසියන්ගෙන් හා බෞද්ධ වන්දනාකරුවන්ගෙන් අනුරාධපුර පූජා භූමිය පිරී ඉතිරී යයි. එක වර නැගෙන 'සාධු' නාදයෙන් සැදැහැති සිත් නිවී සැනසෙයි. බැලූ බැලූ තැන්හි දුර කතර ගෙවා විත් දහස් ගණන් ජනතාව වෙත ප්‍රණීත ආහාරපාන සපයන දන්සල් ය. මෙම බෞද්ධ ප්‍රබෝධයට ප්‍රධාන හේතු කාරකය වූයේ පොසොන් පුන් පොහෝ දින සිදු වූ අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේගේ ලංකාගමනයයි.

බුදුරජාණන් වහන්සේ තෙවරක් ශ්‍රී ලංකාද්වීපයට වැඩම කර ඇති බව සඳහන් වුවත්, මහින්දාගමනයට පෙර කිසිදු ආගමක්, දිවයින තුළ ප්‍රචලිත ව නොපැවතිණ. එක් එක් සුළු කණ්ඩායම් අතර විවිධ ආගමික විශ්වාස පැවතිණි. මිහිඳු මහරහතන් වහන්සේ ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල මහ රහතන් වහන්සේලා ද, සුමන සාමණේරයන් වහන්සේ ද, භණ්ඩුක උපාසකතුමන් ද ප්‍රධාන කොට මිහින්තලා පව්වෙන් ලක්දිවට වැඩමවීමෙන් අපට ලැබුණු උතුම් ම දයාදය ත්‍රිවිධ රත්නයයි. ශ්‍රී ලාංකේය භික්ෂු-භික්ෂුණී පරපුරක් මෙන් ම අට්ඨකථා සහිත ත්‍රිපිටකයක් ද, සර්වඥ ධාතු ද අපට ලැබුණේ මහින්දාගමනය නිසා ය. බුදු දහම ස්ථාපිත වීමත් සමග ම ශ්‍රී ලාංකේය අනන්‍ය බෞද්ධ සංස්කෘතියක් ලක්දිව තුළ ආරම්භ විය. උපතේ සිට මරණය දක්වා යහපත් ආචාර ධර්ම පිළිපදිමින් දැහැමි දිවි පෙවෙතක් ගත කිරීමටත්, නිරතුරු ව ම ත්‍රිවිධ රත්නයේ ආශීර්වාදය තුළින් තම ජීවිත සාර්ථක කර ගැනීමටත් ශ්‍රී ලාංකික බෞද්ධ ජනතාව හුරු වූහ. විහාරස්ථානය කේන්ද්‍ර කරගත් බෞද්ධ සමාජය, ගමයි - පන්සලයි - වැවයි - දාගැබයි යන ආකෘතියට අනු ව නිර්මිත විය. ජනතාව දැහැමි ආර්ථික රටාව

ඇසුරු කරගෙන ජීවත් වන අතර ආධ්‍යාත්මික පෝෂණය විහාරස්ථානීය භික්ෂූන් වහන්සේලා ඇසුරෙන් ලබන්නට පුරුදු වූහ.

මෙම නව හැඬගැස්ම වඩාත් තහවුරු වීමට මහින්දාගමනයෙන් පසු උඳුවප් පුර පසළොස්වක පොහෝ දින සංඝමිත්තා තෙරණිය ජය ශ්‍රී මහා බෝධි දක්ෂිණ ශාඛාව රැගෙන, අටළොස් කුලයක ශිල්පීන් සමග වැඩම කිරීම ද හේතු විය. ලක්දිවට ම සුවිශේෂී වූ කලා ශිල්ප විකාශනයට එය ප්‍රබල ලෙස බලපෑවේ ය. බුදු දහමින් ලැබුණු අර්ථවත් බුද්ධි ගෝචර ජීවන ප්‍රතිපදාව ශ්‍රී ලාංකේය ජන සමාජයේ ජාතික, ආගමික, සංස්කෘතික ආදි ක්ෂේත්‍ර ගණනාවක පිබිදීමට හේතු විය.

විවිධ ඇදහිලි, විශ්වාස අනුගමනය කරමින් සිටි ජනතාවට බුදු දහමින් නව ආලෝකයක් ලැබිණි. මළවුන් ඇදහීමට පුරුදු වී සිටි ජනතාව ඒ වෙනුවට මළවුන් සිහි කර පින් දීමට පුරුදු වූයේත්, දෙවියන්ට පුද පූජා පැවැත්වීම වෙනුවට පින් අනුමෝදන් කිරීමට පුරුදු වූයේත් මහින්දාගමනයට පසු ව ය. ජනතාව පොදුවේ පිළිගත් දහමක් නොතිබුණු අවදියක බුදු දහම රජයේ ආගම බවට පත් විය.

සාමාන්‍ය ජන ජීවිතයේ පැවැත්ම බුදු දහම පදනම් කොට ගෙන ගොඩනැගීම නිසා නිවැරැදි අර්ථවත් දිවි පෙවෙතක් ජනතාවට හිමි විය. ඒ සඳහා බුදු දහමින් පෝෂිත චාරිත්‍ර වාරිත්‍ර හා සිතුම් පැතුම් ගොඩනැගිණි. සාමාන්‍ය ජන ජීවිතවලට සතර බ්‍රහ්ම විහරණ ද, රාජ්‍ය පාලකයින්ට දස රාජ ධර්ම, සතර සංග්‍රහ වස්තු වැනි බෞද්ධ ඉගැන්වීම් ද බොහෝ සේ උපකාරී විය. ඒ නිසා ම රටේ පාලකයා බෞද්ධයෙකු විය යුතු ය යන සම්මතය රට තුළ ගොඩ නැගිණි.

ගෘහ නිර්මාණ ශිල්පය, ත්‍රිවිධ චෛත්‍ය නිර්මාණ ඇසුරින් පෝෂණය විය.

- ශාරීරික චෛත්‍යය - වෙහෙර වහන්සේ මූලික කරගෙන ස්තූප අංග සහ චේතියඝර නිර්මාණ



*පොළොන්නරුව වටදාගෙය*

- පාරිභෝගික චෛත්‍යය - බෝධීන් වහන්සේ වටා ඉදි වූ බෝධිඝර නිර්මාණ



*සිතුල් පව්ව*

● උද්දේසික චෛත්‍යය - පිළිම වහන්සේ, පටිමාඝර ආදි ගෘහ නිර්මාණ



*ලංකාතිලකය*

ත්‍රිවිධ චෛත්‍ය මූලික කරගෙන විවිධ පුද පූජා ක්‍රම බිහිවිය.

උදාඃ- දළදා පූජාව
බෝධි පූජාව
බුදු පිළිම වන්දනාව

බෝධි පූජාව ක්‍රමයෙන් බෞද්ධයා අතර ඉතා ජනප්‍රියත්වයට පත් ව ඇත.

ප්‍රාකෘත පාලි බ්‍රාහ්මී අක්ෂර මිශ්‍ර අපට ම අවේණික වූ ලේඛන කලාවක් ගොඩ නැගීම සාහිත්‍යයේ වර්ධනයට හේතු විය. මාතලේ අලු විහාරයේ දී සිදුකළ සිව් වන සංගායනාවේ ප්‍රතිඵල ලෙස ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම ඉතා වැදගත් අවස්ථාවකි. හෙළ අටුවා සම්පාදනය ද සිදු විය. බුදු දහම ඇසුරින් පෝෂිත ගද්‍ය පද්‍ය සාහිත්‍යයක් බිහිවිය. බුත්සරණ, අමාවතුර, සද්ධර්ම රත්නාවලිය හා පන්සිය පනස් ජාතක පොත වැනි ගද්‍ය සාහිත්‍ය කෘතීන්

මෙන් ම සසදාවත, මුවදෙව්දාවත, කව්සිළුමිණ වැනි පද්‍ය සාහිත්‍ය කෘතීන් ද උදාහරණ ලෙස දැක්විය හැකි ය. එපමණක් ද නොව ජන කවි, ජන කතා පවා පෝෂණය වූයේ බුදු දහමේ ආභාසය ඇසුරෙනි.

ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම වීමේ දී පැමිණි අටළොස් කුලයක ශිල්පීන් නිසා මෙරට කැටයම්, මූර්ති, චිත්‍ර, ගෘහ නිර්මාණ ශිල්පය, වාරි කර්මාන්තය ආදි විවිධ ක්ෂේත්‍රවල ශිල්පීය ඥානය වර්ධනය විය.

රළු - දැඩි කළු ගලින් දයා කරුණා හරිත බුද්ධ ප්‍රතිමා මෙන් ම සියුම් කැටයම් සහිත සඳකඩපහණ නිර්මාණ ද බිහි විය. එවැනි ශිල්පීය දක්ෂතා එළි දැක්වීමේ දී නිරන්තරයෙන් පුද්ගල මානසික ශික්ෂණය ද ප්‍රකට විය. බෞද්ධ ඉගැන්වීම්වලට එකඟ ව සෞන්දර්ය රස විඳීමට ශ්‍රී ලාංකික ජනතාව හුරු විය.

වෙසක්, පොසොන්, ඇසළ උත්සව හා කඨින, වප් මගුල් උත්සව ආදි විවිධ අවස්ථා පාදක කරගෙන උත්සව සංස්කෘතියක් ඇති විය. ප්‍රධාන ජීවනෝපාය වූ කෘෂිකාර්මික කටයුතුවල දී බෞද්ධ චාරිත්‍ර වාරිත්‍ර අනුගමනය කරන ලදි. බෞද්ධ ආභාසය ඇසුරින් පුද්ගල නාම පවා භාවිත කර ඇති බව බුද්ධදාස, බෝධිරත්න, සංඝදාස වැනි ආදි නම් භාවිත කිරීමෙන් පැහැදිලි වේ.

දාන, සීල, භාවනා, පිරිත් පිංකම් ආදියෙන් මෙන් ම පෙරහැර, වන්දනා ගමන් ආදිය මගින් ද ධාර්මික සුවය ලබන්නට බෞද්ධ ජනතාව පෙළඹුණි. ගමේ විහාරස්ථානය ආගමික, අධ්‍යාපනික හා සංස්කෘතික මධ්‍යස්ථානයක් ලෙස විවිධ සේවා ඉටු කරයි. මහින්දාගමනයෙන් ලද දයාද වන ත්‍රිවිධ රත්නය සැදැහැබර වූ ගෞරවයෙන් ආරක්ෂා කර ගැනීම අප සතු වගකීමකි. බුදුරජාණන් වහන්සේ වෙනුවට වන්දනා කිරීම සඳහා පිහිටුවාගෙන ඇති ත්‍රිවිධ චෛත්‍යය අප රැක ගත යුතු ය. එම චෛත්‍ය සැදැහැ සිතින් වන්දනා කළ යුතු ය. ධර්ම රත්නය ආරක්ෂා කිරීම යනු දහම් පොත පත ලිවීම, කියවීම, බණ ඇසීම, බණ දේශනා කරවීම හා බුදු දහමට අනුව ම ජීවත් වීමයි. ත්‍රිවිධ චෛත්‍යත්, දහම් පොත පතත් ආරක්ෂා කර ගනිමින් ජනතාවට බුදු බණ දේශනා කරන අපට යහමග පෙන්වන මහ සඟරුවනට ගරු කිරීම, අපහාස නොකිරීම, සිවුපසය පිරිනැමීම, උන් වහන්සේලාගෙන් ලැබෙන අනුශාසනා පිළිගැනීම, මහ සඟරුවන රැක ගැනීමයි. පැවිදි වී සංඝ සමාජයේ සාමාජිකයකු විය හැකි නම් එය බෙහෙවින් වැදගත් වෙයි.

බෞද්ධ සිරිත් විරිත් බැහැර නොකර අපේ අනන්‍යතාව රැක ගැනීම කළ යුත්තේ ද අප විසින් ම ය. අවමංගල අවස්ථාවන්හි පමණක් නොව මංගලෝත්සවාදියේ දී ද බෞද්ධ සංස්කෘතියට පටහැනි දේ නොකිරීමට අප වග බලා ගත යුතු ය. අපට නියමිත බුද්ධ ධර්ම පාඨ ග්‍රන්ථ නිසි පරිදි හැදෑරීම ද දහම රැක ගැනීමට ගත හැකි පියවරකි.

බෞද්ධ චිත්‍ර ඇඳීමෙන්, බෞද්ධ ගීත නිර්මාණය කිරීමෙන් හා ගායනයෙන්, බෞද්ධ ලිපි ලිවීමෙන්, බෞද්ධ පෙරහර හා උත්සව පැවැත්වීමෙන් ද මහින්දාගමනයේ දායාද රැක ගැනීමට අපට දායක විය හැකි ය.



### සාරාංශය

මහින්දාගමනයෙන් පසු ලක්දිව නව බෞද්ධ පුනර්ජීවයක ආරම්භය සිදු විය. අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ සහ සංඝමිත්තා තෙරණියගේ ආගමනයත් සමග ලක්දිව භික්ෂු - භික්ෂුණී පැවිද්ද ආරම්භ විය. ශ්‍රී ලාංකිකයන්ට ම උරුම වූ හෙළ කලා කෘති මෙන් ම චාරිත්‍ර - වාරිත්‍ර, පුද පූජා, පෙරහැර, උත්සව ද, ලක්දිව පුරා බිහි වී ඇති මූර්ති, කැටයම් හා සිතුවම් තුළින් ද ලාංකික කලා කුසලතාවන් ප්‍රකට කරයි.

**ජාතික මෙන් ම ආගමික වශයෙන් වැදගත් මෙම බෞද්ධ සංස්කෘතිකාංග රැක ගැනීම අපගේ පරම යුතුකමයි.**

## ක්‍රියාකාරකම

1. මහින්දාගමනයෙන් අප ලත් දායාද පහක් නම් කරන්න.

2. අතීත උරුම ආරක්ෂා කිරීමට අප කළ යුතු වන්නේ මොනවා ද යි ලියන්න.

## පැවරුම

'හෙළ කලා කෘති' නමින් අනුරාධපුර, පොළොන්නරුව, මහනුවර යුගවල ගෘහ නිර්මාණ සහ සිතුවම් කලා නිර්මාණ එකතුවක් පිළියෙල කරන්න.